
සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| අනාවරණ පරීක්ෂණය | පැය 02 යි |
| கண்டுபிடிப்பு சோதனை | 02 மணி நேரம் |
| Diagnostic Test | 02 Hours |
| භූගෝල විද්‍යාව , II | 07 ශ්‍රේණිය |
| புவியியல் II | தரம் 07 |
| Geography II | Grade 07 |

සැලකිය යුතුයි :


- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

01. **(A)** පහත සඳහන් ලෝක ආකෘති සිතියමේ ලකුණු කර ඇති දෑ ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




(1) සමකය දක්වෙන අක්ෂරය .............................................................. වේ.
(2) අත්ලාන්තික් සාගරය දක්වෙන අක්ෂරය .........................................වේ.
(3) ලෝකයේ විශාලතම දූපත දක්වෙන අක්ෂරය ................................ වේ.
(4) **D** අක්ෂරයෙන් දක්වෙන මහාද්වීපය ................................................ යි.
(5) මැඩගස්කර දූපත දක්වෙන අක්ෂරය .............................................. වේ.
(6) G අක්ෂරයෙන් දක්වෙන දූපත් සමූහය .................................. දූපත් ලෙස හඳුන්වයි.

(ල.06) **(B)** පහත දැක්වෙන ශ්‍රී ලංකා ආකෘතික සිතියමේ ලකුණු කර ඇති දෑ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(1) නිරිත දිග මෝසම දැක්වෙන අක්ෂරය .................................. වේ.

(2) **A** අක්ෂරයෙන් දැක්වෙන වරාය ............................................ යි.

(3) මහවැලි ගඟ දැක්වෙන අක්ෂරය .......................................... වේ.

(4) **E** අක්ෂරයෙන් සේයා කර ඇති දිස්ත්‍රික්කය ............................. යි.

(5) මන්නාරම් දූපත දක්වා ඇති අක්ෂරය ................................ වේ.

(6) **G**අක්ෂරයෙන් දැක්වෙන නගරය ........................................ වේ.


(ල.06)

**(C)** ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ වල වැවෙන ශාක වල ස්වභාවය අනුව ඒවා විවිධ පරිසර පද්ධති වලට වෙන් කරයි. පහත රූපවලින් දැක්වෙන්නේ එවැනි පරිසර පද්ධති වල වැවෙන ශාක වර්ගයි. එම රූප හඳුනාගෙන ඒවා අයත් පරිසර පද්ධති අක්ෂර පිළිවෙලින් නම් කරන්න.

| **A** | **B** | **C** | **D** |
|---|---|---|---|
|  |  |  |  |

(ල.04)

02. පෘථිවි ආදර්ශ ගෝලයේ රූප සටහනක් පහතින් දැක්වේ. ඒ ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




(1) ඉහත ආදර්ශගෝලයේ A B රේඛාවෙන් දැක්වෙන ප්‍රධාන දේශාංශ රේඛාව නම් කරන්න.

(ල.02) (2) ඉහත ආදර්ශ ගෝලයේ අක්ෂාංශ $0^0$ රේඛාව හඳුන්වන නම කුමක් ද? (ල.02)

(3) අක්ෂාංශ 0º රේඛාවෙන් පෘථිවි ගෝලය කොටස් දෙකකට බෙදෙයි. එම කොටස් දෙක නම් කරන්න. (ල.02)


(4) E F රේඛාවෙන් දැක්වෙන අක්ෂාංශ රේඛාව නම් කරන්න. (ල.02)

(5) රටක පිහිටීම දැක්විය හැකි ක්‍රම දෙකකි. එම ක්‍රම දෙක සඳහන් කරන්න. (ල.03)

**03.** යාබද ලෝක සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) සිතියමේ A ,B හා C අක්ෂරවලින් දැක්වෙන්නේ රියෝද ජැනයිරෝ, සැන්ප්‍රැන්සිස්කෝ හා කයිරෝ යන නගරයන් ය. ඒවා A,B හා C පිළිවෙලින් නම් කරන්න. (ල. 03)


(2) ඉන්දියන් සාගරයේ ශ්‍රී ලංකාවට ආසන්නව පිහිටි දූපත් තුනක් නම් කරන්න. (ල. 03)




(3) සිතියමේ අංක 1 සිට 5 දක්වා ඇති රටවල් පිළිවෙලින් නම් කරන්න.

(ල. 05)

**04.** (1) දකුණු ආසියානු කලාප සිතියම පහතින් දැක්වේ. එහි අක්ෂර වලින් දැක්වෙන රටවල නම් වරහන් තුළින් තෝරා ඉදිරියෙන් ලියන්න. (ල. 06)




:නේපාලය / භූතානය / මාලදිවයින / ඉන්දියාව බංගලාදේශය / පකිස්ථානය)

A.....................................................
B.....................................................
C.....................................................
D.....................................................
E.....................................................
F ශ්‍රී ලංකාව
G.....................................................

(2) වරහන් තුළ ඇති නිවැරදි පිළිතුරු තෝරා පහත හිස්තැන් පුරවන්න.

පෘථිවිය නිර්මාණය වී ඇත්තේ විශාල සාගර හා මහාද්වීප වලිනි. සාගර ජලයෙන් වට වූ
විශාල ගොඩබිම් ප්‍රදේශ (1)................................ ලෙස හඳුන්වනු ලබයි. ලෝකයේ පිහිටා ඇති විශාලතම සාගරය (2).................................. වේ.
(3).................................. කඳු මුදුන
ලෝකයේ උසම ස්ථානය වන අතර ලෝකයේ ගැඹුරුම ස්ථානය
(4).................................. අගාධය වේ. ඉන්දියන් සාගරයේ
(5).................................. ක් ලෙස ශ්‍රී ලංකාව පිහිටා ඇත.

(එවරස්ට් / දූපත / මරියානා / අත්ලාන්තික් / පැසිෆික් / මහාද්වීප) (ල.05)

**05.** ශ්‍රී ලංකාවේ වැඩිම භූමි ප්‍රමාණයක් අයත්වන්නේ වියළි කලාපීය භූ දර්ශනයට යි.
(1)ශ්‍රී ලංකාවේ වියළි කලාපීය භූ දර්ශනය දැකිය හැකි පළාත් තුනක් නම් කරන්න.
(ල. 03)

(2)වියළි කලාපීය භූ දර්ශනයේ පදනම සකස්වීමට බලපා ඇති දේශගුණික සාධක තුනක් දක්වන්න.

(ල. 03)

(3) තෙත් කලාපීය භූ දර්ශනයේ ලක්ෂණ කිහිපයක් අංක 1 සිට 5 දක්වා රූප සටහන් වලින් දැක්වේ. ඒවා නිවැරදිව හඳුනාගෙන නම් කරන්න. (ල. 05)



1



2



3




4



5

**06.** රටක පිහිටීම ප්‍රකාශ කළ හැකි ක්‍රම දෙකකි.

(1) ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නව පිහිටීම නිසා ලැබී ඇති වාසි දෙකක්
ලියන්න. (ල. 02)

(2) (a) නිරපේක්ෂ පිහිටීම යනු කුමක් ද? (ල. 02)

(b) ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ පිහිටීම දැක්වෙන පහත සටහනේ හිස්තැන් පුරවන්න.

ශ්‍රී ලංකාව උතුරු අක්ෂාංශ (1) .................................. හා $9^0$ 51′ අතර ද

(2) ........................... දේශාංශ $79^0$ 41′ හා (3) ............................... අතර ද පිහිටා

ඇත. (ල. 03)

(3) ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම පහත දිශාවන්ට අනුව දක්වන්න.

1. උතුරින්
2. දකුණින්
3. නැගෙනහිරින්
4. බටහිරින් (ල. 04)

**07.** (1) ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය උසස් මට්ටමක පැවතීම කෙරෙහි බලපාන සාධක කිහිපයක් පහත කොටුවලින් දක්වේ. එම සාධක වගුවේ ඇති එක් එක් අංශය යටතට වෙන් කර දක්වන්න.

| පෝෂ්‍යදායි ආහාර වේලක් ලබාගත හැකිවීම. | වෛද්‍ය හා සෞඛ්‍යය පහසුකම් දියුණු වීම. | අධ්‍යාපන පහසුකම් දියුණු වීම |
|---|---|---|
| උදා.:- ලෙඩ රෝග වලට ඔරොත්තු දීමේ හැකියාව වැඩිවීම. | ආයු අපේක්ෂාව වැඩිවීම. | සාක්ෂරතාව වැඩි දියුණු වීම. |
| 1. | 3. | 5. |
| 2. | 4. | 6. |
| | | 7. |
| | | 8. |

- ලෙඩරෝග වලට ඔරොත්තු දීමේ ශක්තිය වැඩි වීම.
- ආයු අපේක්ෂාව වැඩිවීම.
- ජීවන මට්ටම ඉහළ යාම.
- යහපත් ආකල්ප ඇතිවීම.

- කායික හා මානසික පෝෂණය වැඩි වීම.
- ආයු අපේක්ෂාව වැඩි වීම.
- ළදරු මරණ අඩු වීම.
- හොඳ රැකියා අවස්ථා ඇතිවීම.

- ආයු අපේක්ෂාව වැඩිදියුණු වීම.
- මාතෘ මරණ අඩු වීම.

- සෞඛ්‍යය සම්පන්න ජීවිතයක් ගතකිරීමට පෙළඹීම.

(ල.08)

(2) ශ්‍රී ලංකාවේ ජනතාවගේ අකුරු ලිවීමේ හා කියවීමේ හැකියාව ඉහළ මට්ටමක පැවතීමට බලපාන කරුණු 03 ක් සඳහන් කරන්න.
(ල.03)